## 25. 2001 අංක 03 දරණ පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීම) ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

**1.** මෙම ප්‍රඥප්තිය 2001 අංක 03 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීම) (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය

**2.** 1989 අංක 06 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීම) ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (අ) (ආ) ඡේද 2001.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන අයුරු මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1989 අංක 06 දරන ප්‍රඥාප්තියේ දෙවන වගන්තියේ සංශෝධනය කිරීම.

(අ) දකුණු පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ මාසික වැටුප සහ දීමනාව රුපියල් හත් දහසක්ද (7 000) ද :

(ආ) දකුණු පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකුගේ මාසික වැටුප සහ දීමනාව රුපියල් පන්දහස් පන්සීයයක් (5 500) ද ගෙවිය යුත්තේය.

**3.** 1999 අංක 01 දරන සංශෝධනය ප්‍රඥප්තිය මෙයින් අවලංගු කරනු ලැබේ.